**පාතදුම්බර ප්‍රාදේශීය සභාව - 2022**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෝටර් රථ හා කරත්තවල තක්සේරු වටිනාකම රු.3,640,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කර ගන්නා බව. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.2,496,000 ක ලී බඩු හා උපකරණ ලී බඩු යටතේ හා පොදු ගබඩා තොගය යටතේ ද ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.1,565,730 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ බැකෝ යන්ත්‍ර ආදායම රු.260,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂ හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.21,337,156 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු සොයා බලා නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | ගිණුම්ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් මහජන පුස්තකාල 07 ක ඇප තැන්පත් ශේෂය රු.231,860 ක් සනාථ කර ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීය. | ඉදිරියේදී ලේඛනය නිවැරදිව පවත්වාගෙන යන බව. | ලේඛන පවත්වා ගත යුතුය. |
| (ආ) | එකතුව රු.14,910,192 ක වත්කම් ශේෂ 02 කට අදාළ උප ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී උප ලේඛන සැපයීමට කටයුතු යොදා ඇති බව. | අවශ්‍ය උප ලේඛන පවත්වාගත යුතුයි. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | වාහන 20 ක සමාලෝචිත වර්ෂයට අදාළව දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,529,254 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,269,675 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,793,650 | 7,398,528 | 7,771,493 | 4,967,208 | 5,768,686 | 7,490,268 | 11,712,568 | 5,340,173 |
| (ii) | කුලී | 5,137,560 | 4,185,954 | 4,632,263 | 339,027 | 3,358,392 | 3,550,993 | 3,065,900 | 785,336 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,728,000 | 3,873,232 | 3,873,232 | - | 2,282,000 | 3,003,365 | 3,003,365 | - |
| (iv) | වෙනත් ආදායම් | 66,505,449 | 12,730,656 | 55,399,234 | 22,538,404 | 59,370,220 | 24,537,111 | 29,697,386 | 65,206,982 |
| | | 80,164,659 | 28,188,370 | 71,676,222 | 27,844,639 | 70,779,298 | 38,581,737 | 47,479,219 | 71,332,491 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.4,967,208 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ දේපල 195 කින් එකතුව රු.1,792,345 ක වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජංගම සේවා මගින් ආදායම් රැස් කරන බව. | හිඟ ආදායම් රැස්කර ගත යුතුය. |
| (ii) | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වසර 05 කට වරක් වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුකළ යුතු වුවද 2011 වර්ෂයේදී සිදුකරන ලද වරිපනම් තක්සේරුවක් මත පදනම්ව වරිපනම් බදු අයකර තිබුණි. | නව තක්සේරුවක් කඩිනමින් ලබා ගන්නා බව. | නිසි පරිදි දේපල තක්සේරු කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.1,208,005 ක් වූ අතර, එක ඒකකයක ජල ගාස්තු හිඟය රු.5,000 ඉක්මවූ ජල පාරිභෝගික ඒකක 18 කින් එකතුව රු.157,276 ක ජල ගාස්තු හිඟයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජංගම සේවා පැවැත්වීමට කටයුතු යොදා ඇති බව. | හිඟ ආදායම් රැස් කළ යුතුය. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.74,667 ක් හා මුද්දර ගාස්තු රු.17,472,284 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ජපන් තාක්ෂණික ස්වායු ස්වයංක්‍රීය හා කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන සඳහා 2016 ඔක්තෝබර් 12 වන දින එකඟතා ගිවිසුමකට දෙපාර්ශවය අත්සන් තබා තිබුණු අතර 2022 ජූලි මස සිට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ගිවිසුම් කඩ වීමෙන් වන මූල්‍ය අලාභය අයකර ගැනීම හෝ ආරවුලක් ඇති වූ විට ක්‍රියාත්මක විය යුතු ආකාරය ගිවිසුමේ සඳහන්ව තිබුණත් විගණිත දිනය වූ 2023 මාර්තු 21 දින වන විටත් මෙම ගැටළුව නිරාකරණය කරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය අනුව මහජන සෞඛ්‍ය බලධාරියා ලෙස සභාව කටයුතු කළයුතු බව දැක්වුවද සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක පානීය ජල යෝජනා ක්‍රම 05 ක ජල සාම්පල් පරීක්ෂාවක් සිදු නොකර පානීය ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | ජල සාම්පල් වාර්ෂිකව පිරික්සීමට වග බලා ගන්නා බව. | ජල සාම්පල් පරීක්ෂා කර පිරිසිදු ජලය බෙදාහැරිය යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.4,473,240 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.3,749,238 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.724,002 ක ශේෂ අයකර ගෙන නොතිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශය විසින් මුදල් ප්‍රතිපූර්ණය කර නොමැති බව. | ලැබිය යුතු මුදල් අයකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂ එකතුව රු.45,502,403 ක් වූ අතර ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.1,859,473 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.1,265,827 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට භෞතිකව නොතිබුණු රු.215,570 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ දක්වා තිබුණි. | ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සොයා බලා නිවැරදි කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.62,790,706 ක ඉඩම් හා ගොඩනැගිලි සඳහා අයිතිය පවරාගෙන නොතිබුණි. | අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු යොදා ඇති බව. | අයිතිය පවරා ගත යුතුය. |
| (ඉ) | සභාව පරිහරණය කරන වාහන 02 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇති බව. | අයිතිය පවරා ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.5,060,000 ක වාහන 04 ක් හා වටිනාකම හඳුනාගෙන නොමැති යන්ත්‍ර 01 ක් වසර 06 සිට 13 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කිරීමට හා වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කිරීමට හා වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 08 ක සියයට 18 සිට සියයට 87 දක්වාද, වියදම් විෂයයන් 08 ක සියයට 08 සිට සියයට 97 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙවන් ගැටළු ඇති නොවන සේ සකස් කරන බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය වෙන්කරවා ගත යුතුය. |

**4.2 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යම් තරමකින් එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇති බව. | පනතේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |